PRESS RELEASE
Communications Department, 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| Issued By | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| Date | 2025 අගෝස්තු 15 |

## ශ්‍රී ලංකා මහ බැංකුව 2025 අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරයි

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව, මහ බැංකුව 2025 වසර සඳහා සිය දෙවන මුදල් ප්‍රතිපත්ති වාර්තාව නිකුත් කළේය. මෙම ද්විවාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තාව මගින් ආර්ථිකය පිළිබඳ ඉදිරි දැක්මක්, විශේෂයෙන්ම උද්ධමනය හා ආර්ථික වර්ධනයට අදාළ ඉදිරි දැක්ම මෙන්ම ඒවායේ පුරෝකථන සඳහා පවතින අවදානම් පිළිබඳව ඇගයීමක්, සපයයි. මෙම වාර්තාව හරහා මැත කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා මූලික වූ පසුබිම සන්නිවේදනය කිරීම තුළින් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීමට ප්‍රයත්න දරයි.

මෙම වාර්තාවේ අන්තර්ගතය, 2025 ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයට අදාළ තීරණය ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් සලකා බලන ලද තොරතුරු මත පදනම් වේ.

**සුවිශේෂී කරුණු**

- ඉල්ලුම පදනම් කරගත් උද්ධමන පීඩන අඩුවීම සැලකිල්ලට ගනිමින් මහ බැංකුව සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.
- 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට වාර්තා වූ අවධමනය 2025 වසරේ තෙවන කාර්තුවේ දී අවසන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ඉල්ලුම් තත්ත්ව වැඩිදියුණු වීමත් සමඟ 2026 වසරේ මැද භාගය වන විට උද්ධමනය 5%ක ඉලක්කය වෙත ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ.
- මූලික උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉන් පසුව මතුපිට උද්ධමන ඉලක්කයට අනුකූලව ස්ථාවර වනු ඇත.
- 2025 වසරේ දී ආර්ථිකය 4.5%කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- වෙනස්වන ගෝලීය අවිනිශ්චිතතා ආර්ථික වර්ධන අපේක්ෂා කෙරෙහි අභියෝග ඇති කරයි.

*මාර්ගගත ප්‍රකාශනයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව මහ බැංකු නිල වෙබ් අඩවියේ පහත සබැඳියෙන් ලබා ගත හැකිය [https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-සහ-මූල්‍ය-වාර්තා/මුදල්-ප්‍රතිපත්ති-වාර්තා](https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-සහ-මූල්‍ය-වාර්තා/මුදල්-ප්‍රතිපත්ති-වාර්තා)*